# මලිඳුට පාඩමක්



සෙනුලි ගෙහන්සා වීරසිංහ

# මලිඳුට පාඩමක්

## කතෘ : **සෙනුලි ගෙහන්සා වීරසිංහ**

කෘතිය පළ කරන දිනය : 2023 -11 -15

# පිදුම

මාගේ කුළුඳුල් ග්‍රන්ථය,

සෙනෙහෙ පිරුණු සිතින්

දයාබර අම්මාටත්

අප්පච්චිටත්

බැති සිතින්

පුදමි . .

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායි පුරවැසියෙකු සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවයන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැංවීම අපේක්ෂාවයි. එසේනම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතාව හඳුනාගෙන ඒවා ඔපවත් කිරීම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩ ගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛණකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සාහිත්‍ය පොතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවන් සපුරාලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාට් දරුවන්ට ගැලපෙන ලෙස නවීකරණය කරමින් **“දිවිය දිනන විද්‍යුත් පොතක්”** ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක්

මෙන්ම ගත් කතුවරයෙකු වීම හරහා ජීවිතේට එකතු වන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොත් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගය කරමි .

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට එක්වූ පුංචි වේග ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියටද ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු .

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලයේ ගුරුභවතුන්, දෙමාපියන්, ආදිශිෂ්‍යාවන්, සෙසු පාසල්වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන්, ගුරුභවතුන්, මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට ස්තුතියි මෙමගින් පිරිනමමි .

සසිකලා සේනාධීර,
විදුහල්පතිනි,
මහමායා බාලිකා විද්‍යාලය,
මහනුවර.
2023.11.01

මලිඳුට හිටියේ මල්ලි කෙනෙක් විතරයි. මේ මල්ලි මලිඳු අයියට හරිම ආදරෙයි. මලිඳු අයියත් තමන්ගේ මල්ලිට ගොඩක් ආදරෙයි.



දවසක් මලිඳුගේ අම්මා මලිඳු එක්ක ළඟ තිබුණ කඩයට ගියා. අම්මා ගෙදරට ඕන කරන බඩු මිලදී ගත්තා. අම්මා ළඟ ඉතුරු උනු සල්ලි වලින් අයියටයි මල්ලිටයි බෙදාගෙන කන්න කියලා අයිස් ක්‍රීම් එකක් ඇරන් දුන්නා.



අයිස් ක්‍රීම් එක අරගෙන ගෙදරට ආව මලිඳුට එය මල්ලිට දෙන්න ලෝභ හිතුනා. එය තනියම කන්න ලොකු ආසාවක් දැනුණා.මිඳුලේ පඳුරක් අස්සේ අයිස් ක්‍රීම් එක හංගලා ගේ ඇතුළට ගියා.



අම්මා දෙදෙනාටම බෙදාගෙන අයිස් ක්‍රීම් එක කන්න කීවත් මලිඳු එය මඟ වැටී ඇති බවට බොරුවක් කීවා. පසුව මලිඳු මල්ලිටත් හොරා මිදුලට ගොස් අයිස් ක්‍රීම් එක කන්න ගියත් එතැන රෝස පාටට වතුර ගලාගෙන ගොස් තිබෙනු මලිඳු දුටුවා.



තමා කීව බොරුව වගේම වැඩි ආසාවක් නැතිව මල්ලි සමඟ බෙදාගෙන කෑවනම් මෙහෙම වෙන් නෑ නේ දැයි සිතා මලිඳු ඉතාම දුක් වුණා.



ඉතින් පුංචි යාළුවනේ ඔයාලනම් කවදාවත් බොරු කියන්න, ලෝභ හිතන්න එපා.

එහෙම කළොත් ඔයාලටත් මලිඳු වගේ දුක් වෙන්න වේවි.



නිමි.

# පසු වදන



නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතු වීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනය හේතුකොටගෙන පොතපතින් දරස් වන පාසල් දරුවන් නැවත පොතපතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම, ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාණ හැකියාවන් ඔප්නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි කතුවරියන්ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අතෙකින් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාව ශාස්ත්‍රීය වගකීම් ප්‍රදර්ශනාගාරයේ කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භ කර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජාත්‍යන්තරයට ඩිජිටල් වේදිකාවට පිවිස හත්පතු අංකුර බවට ලෝකය දිනන ගත් කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට<br>
සෙනෙවිරත්න මහලේකම්<br>
පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතීන් නිර්මාපක<br>
2023.11.01